**කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යන්ත්‍ර හා උපකරණ වටිනාකම රු.25,365ක් සහ රු.236,000ක් වූ වැන් රථය සමාලෝචිත වර්ෂයේ දී ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ශේෂය රු.102,748 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 9ක මූල්‍ය ප්‍රකාශන අනුව හා උප ලේඛන අතර එකතු වටිනාකම රු.24,238,819ක වෙනසක් පැවතුණි. | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී උපලේඛන අනුව නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් සකස් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

**2. මූල්‍ය සමාලෝචනය**

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) | | | |
| (i) | රීති 59 සිට රීති 66 | වර්ෂයක ආරම්භයේදීම සභා බල ප්‍රදේශයේ කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් සිදුකර කර්මාන්ත බදු ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | සියළුම කර්මාන්ත බදුලේඛනයට ඇතුලත් කිරීමට පියවර ගන්නා බව. | අදාළ රීති උපදෙස් අනුව ක්‍රියාකළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | තැන්පත්කර වසර 2 කට වැඩි කාලයක් පැවති තැන්පතු 04 ක වටිනාකම රු.277,657ක් නියාදනය කර නොතිබුණි. | ආදායමට බැරකර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 ජනවාරි 10 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ අංක 2019/02 හි 03 ඡේදයෙහි I හා II වගන්ති | කඩකාමර බදුදෙනු ලබන ගිවිසුම්ගත කාලය සභා තීරණයක් මත වසර 03 ක් දක්වාත් විෂයභාර ඇමතිවරයාගෙන් අනුමැතියෙන් වසර 03 සිට 30 දක්වා විය යුතු වුවත්, වෙළඳ සංකීර්ණ කඩ කාමර සඳහා ගිවිසුම්වල බදු කාලය සඳහන් කර නොතිබුණි. | ගිවිසුම් නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | යථෝක්ත චක්‍රලේඛය අනුව ක්‍රියා කළ යුතුය. |

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.17,294,652 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.3,241,550 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ අදායම | දෙසැම්බර් 31 දිනට හිඟය (පෙර වර්ෂ හිඟය සමග) | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ අදායම | දෙසැම්බර් 31 දිනට හිඟය (පෙර වර්ෂ හිඟය සමග) |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| i. | වරිපනම් හා බදු | 749 | 749 | 749 | 122 | 749 | 749 | 460 | 753 |
| ii. | බලපත්‍ර ගාස්තු | 10,000 | 1,000 | 643 | 357 | 890 | 989 | 989 | - |
| iii | කුලී | 700 | 700 | 104 | 596 | 141 | 141 | 580 | 439 |
| iv. | වෙනත් ආදායම් | 22 | 22 | 15 | 43 | 22 | 22 | 65 | 42 |
| | | 11,471 | 2,471 | 1,511 | 1,118 | 1,802 | 1,901 | 2,094 | 1,234 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | වරිපනම් බදු තක්සේරුව වර්ෂ 05 කට වරක් තක්සේරු දෙපාර්තමේන්තුව ලවා කළ යුතු වුවත් ප්‍රාදේශීය සභාව විසින් 2015 වරිපනම් තක්සේරුව මත දැනට වරිපනම් අය කරනු ලබයි. | සභාවට අයත් වරිපනම් කලාපවලට අදාලව වරිපනම් දේපල හඳුනා ගෙන ගැසට් නිවේදන පලකර වරිපනම් තක්සේරුව සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලුම් කර ඇති බව. | වරිපනම් දේපළ කාලීනව තක්සේරු කර වරිපනම් බදු අය කළ යුතුය. |
| (ii) | මුළු හිඟ වරිපනම්,ශේෂය වූ රු.681,669 න් රු.229,788 ක් එනම් සියයට 3 ක් වර්ෂ 05 ට වැඩි හිඟ ශේෂ විය. | පිළිතුරු ලබා දී නොමැත. | හිඟ වරිපනම් අය කළ යුතුය. |
| **(ආ)** | **අක්කර බදු** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු වසම් 16 ක දේපල 273 කින් රු.51,525 ක ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ අක්කර බදු මුදල් අයකරගැනීම සඳහා මේ වන විට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ අක්කර බදු කඩිනමින් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **අතුරු ව්‍යවස්ථා**<br>ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණ 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොතිබුණි. | කුකුල් කොටු සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව පනවා ගැනීම සඳහා සකසන ලද කෙටුම්පත පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව. | සභාවට ආදායම් උපයා ගැනීමට හැකි අවස්ථා හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂය සඳහා බදුදිය හැකි වත්කම් 21ක් ලංසුකරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් ආදායම් උත්පාදන කාර්යය සඳහා යොදා නොගෙන පැවතුණි. | පිළිගන්නා බව. | සභාව සතු වත්කම් ප්‍රශස්ත ලෙස උපයෝජනය කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු දේපල නිසි පරිදි තක්සේරු කර එම වටිනාකම් පොත්වල ඇතුළත් කිරීමට හා ඉඩම් ගොඩනැගිලි සමීක්ෂණය කාලීනව සිදුකිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල දේපල තක්සේරු කිරීමට පියවර ගත් බව.. | දේපල නිසි පරිදි තක්සේරු කිරීම සහ ගොඩනැගිලි සමීක්ෂණය කාලීනව සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව විසින් බාහිර පාර්ශවවලට ආදායම් උත්පාදන යන්ත්‍ර සූත්‍ර, ජල බවුසර් ලබාදීමේදී සියලු තොරතුරු ඇතුළත් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගත යුතු වුවද, එසේ සිදුකර නොතිබුණි. | අදාල ලේඛන නිසි පරිදි පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | ආදායම් උත්පාදිත යන්ත්‍ර සඳහා ලේඛන යාවත්කාලීනව පවත්වාගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ දී නිකුත් කළ පරිසර බලපත්‍ර අතුරින් කොහු කර්මාන්ත ශාලාවකට හා ෆාම් ආයතනයකට මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ අනුමැතිය රහිතව පරිසර බලපත්‍ර නිකුත් කර තිබුණි. | පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කරගැනීමට කටයුතු කරන බව. | පරිසර බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් විධිමත් කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන වනවිටත් සේවක ණය ශේෂය තුළ සේවකයකුට අදාළව රු.149,992 ක අය නොවන ශේෂයක් පැවතුණි. | මෙම ණය මුදලට අදාළ නිලධාරියා තාවකාලික වැඩතහනමකට ලක්ව දෙපාර්තමේන්තු පරීක්ෂණයකට ලක් කර තිබෙන බව. | සේවක ණය නිසි පරිදි අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් නඩත්තු කරමින් තිබූ වත්කම් 25 ක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල වත්කම් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | වත්කම් කඩිනමින් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සතු වත්කම්වල ආරක්ෂාව හා පැවැත්ම තහවුරු වන පරිදි ඉඩම් හා ගොඩනැගිලිවල වටා ආරක්ෂිත වැටවල් ඉදිකර නොතිබූ අතර සභාව සතු ඉඩම් ගොඩනැගිලි වාර්ෂික සමීක්ෂණයට ලක් කර නොතිබුණි. | අත්‍යවශයෙන් හඳුනාගත් ගත් ඉඩම්වල ආරක්ෂික වැට යෙදීමට කටයුතු කරන අතර සමීක්ෂණ කටයුතු සිදුකර වත්කම් 30ක් පමණ හඳුනාගෙන ඇති බව. | සභාව සතු වත්කම් ආරක්ෂා කර ගැනීමට ප්‍රමාණවත් පාලන ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |
| (ඇ) | සභාව සතු පොල් එලදා ඉඩම් බදු නොදී සභාව විසින් එලදා ආදායම් රැස්කිරීමට තීරණය කර තිබුණද, සභාව සතු පොල් එලදා ඉඩම් නිසි පරිදි හඳුනාගෙන එලදා ආදායම් නිසි පරිදි රැස්කර ගැනීමට කටයුතු නොකිරීම නිසා සභාවට ලැබිය යුතුව තිබූ ආදායම් අහිමි වී ගොස් තිබුණි. තවද සභා තීරණ මත සභාව සතු පොල් එලදා ඉඩම් බදු නොදී සංවර්ධන කාර්යය සඳහා සභාව සතුව තබා ගත් ඉඩම්වල සංවර්ධන කටයුත්තක් සිදු කර නොතිබුණි. | ඉදිරියේදී පොල් එලදා ඉඩම් නිසි පරිදි හඳුනාගෙන ආදායම් නිසි පරිදි රැස් කිරීමට කටයුතු කරන බව. | වත්කම් වලින් ලැබිය යුතු ආදායම් නිසි පරිදි ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.6 නිශ්කාර්ය වත්කම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.1,275,000 ක් වැය දරා කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා මිලදීගෙන තිබූ බේල් යන්ත්‍රය භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | සභා මහජන පුස්තකාලයේ විදුලි සම්බන්ධතාවය තෙකලා විදුලි සම්බන්ධතාවයක් බැවින් එම ස්ථානයේ බේල් යන්ත්‍රය ස්ථාපිත කර භාවිතයට ගැනීමට කටයුතු යොදා ඇති බව. | සභාව සතු වත්කම් ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 04 ක ඇස්තමේන්තුගත හා සත්‍ය ආදායම් අතර සියයට 25 සිට 169 ක විචල්‍යතාවයක් ද වියදම් විෂයයන් 05 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර සියයට 14 ක සිට 72 විචල්‍යතාවයක් නිරීක්ෂණය විම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කර ගෙන නොතිබුණි. | පෙන්වා දී ඇති ගැටළු නිරාකරණයට කර ගැනීමට කටයුතු කරන බව. | තාත්විකව අයවැය පිළියෙල කිරීමට හා ප්‍රතිපාදන ප්‍රශස්තව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. |